*සැ. යු.-* 2013.05.17 දින පළවූ අංක 1,811 දරන ගැසට් පත්‍රයේ I:III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,812 - 2013 මැයි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2013.05.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 486 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 500 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 504 |

*සැ. යු.-* (i) ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූනි මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මැයි මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## යටිනුවර ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

යටිනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් නියමිත සුදුසුකම් සපුරා ඇති යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | විදුලි කාර්මික | 01 | PL2-2006A<br>රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160<br>12 x 170 - රු.18,600 | 01. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06කින් සාමාර්ථය ලබා සිටිය යුතුය. |

(අ) වෘත්තියට අදාලව ජාතික වෘත්තීය සුදුසුකම් 2 වැනි මට්ටමේ (NVQ 2) හෝ 3 වැනි මට්ටමේ (NVQ 3) සහතික ලබා තිබීම ;

*හෝ*

(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) වෘත්තියට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම ;

*හෝ*

(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

(ඈ) ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

*හෝ*

(ඊ) තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.

පළපුරුද්ද :-

අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම. (පුහුණු කාලසීමාව යටත් පිරිසෙයින් අවුරුදු 02ක් වත් විය යුතුය.)

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 02 | අදාහනාගාර භාරකරු | 01 | PL1-2006A<br>රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145<br>12 x 160 - රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා සිටිය යුතු ය. |
| 03 | මාර්ග කම්කරු | 01 | PL1-2006A<br>රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145<br>12 x 160 - රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා සිටිය යුතු ය. |
| 04 | පුස්තකාල සහායක | 03 | PL1-2006A<br>රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145<br>12 x 160 - රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල, දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා සිටිය යුතු ය. |
| 05 | ආදාහනාගාර සහායක | 01 | PL2-2006A<br>රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145<br>12 x 160 - රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා සිටිය යුතු ය. |

02. *වෙනත් සුදුසුකම් :*

*(i)* අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
*(ii)* විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
*(iii)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
*(iv)* අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු යි.
*(v)* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබුවකු නොවිය යුතු ය.

02. *සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

*(i)* මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.
*(ii)* පත්වීම අවුරුදු 03ක පරිපාස කාලයකට යටත්වේ.
*(iii)* මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුදෙනා බැඳී සිටිය යුතු ය.

04. සුදුසුකම් සපුරාලන අයවළුන්ගෙන් අයදුම්පත් කැඳවීමෙන් පසුව සම්මුඛ පරීක්ෂණයක් සඳහා භාජනය කරනු ඇත.

05. අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ද එවිය යුතු ය.

*(i)* උප්පැන්න සහතිකය;
*(ii)* අධ්‍යාපන සහතික;
*(iii)* පදිංචි සනාථ කිරීමේ සහතිකය;
*(iv)* මැතක දී ලබාගත් චරිත සහතික දෙකක්;
*(v)* මැතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකය;
*(vi)* වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික ;
*(vii)* පළපුරුද්ද දැක්වෙන සහතික.

තනතුර ඉල්ලීම අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පතක් 2013.06.11වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, යටිනුවර ප්‍රාදේශීය සභාව, ඇඹිල්මීගම, පිළිමතලාව" යන ලිපිනයට එවිය යුතු ය. අදාළ අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර සඳහන් කළ යුතුය.

සී. පී. නවරත්න,
ලේකම්,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2013 අප්‍රේල් මස 29 වැනි දින,
යටිනුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත

*යටිනුවර ප්‍රාදේශීය සභාව*

*................................................................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. මුලකුරු සමග නම :————————,
02. මුලකුරු වලින් හැඳින්වෙන නම්:————————,
03. ස්ථිර ලිපිනය:————————,
04. ස්ත්‍රී/පුරුෂ භාවය :————————,
05. උපන් දිනය :
අවුරුද්ද :————————, මාසය :————————, දිනය :————————,
06. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද/ලියාපදිංචියෙන් ද:————————,
07. අධ්‍යාපන සුදුසුකම් :————————,
(1) අ.පො.ස. (සා.පෙළ) විභාගය :-
සමත් වර්ෂය හා විභාග අංකය :-

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

(2) වෙනත් සුදුසුකම් : ————————,
08. වෘත්තීය සුදුසුකම් :————————,
09. සේවා පළපුරුද්ද :————————,

(i). දැනට සේවය කරන ආයතනය :————————,
(ii). දැනට දරන තනතුර :————————,
(iii). එම තනතුරට පත් වූ දිනය :————————,
(iv). පෙර සේවය කරන ස්ථානයේ දරන ලද තනතුර :————————,

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා, නිවැරදි බව, ප්‍රකාශ කරමි. මෙම බඳවාගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා සාවද්‍ය තොරතුරු දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————,

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන .................................................. මයා මෙම ආයතනයේ ............................................................ වශයෙන් සේවය කරයි. ඔහු සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු මොනම ආකාරයේ හෝ නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශකර ඉදිරිපත් කරමි.

————————,
ආයතන ප්‍රධානියා.

ආයතනය :————————,
නම:————————,
පදවිය:————————,
දිනය:————————,

05-492

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### සීතාවක ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සීතාවක ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් ස්ථිර, තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හා ව්‍යාපෘති පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| සෞඛ්‍ය කම්කරු (කා.සේ.සේ. III පන්තිය) | 01 | රා. ප. ච. 06/2006 (IV) අනුව PL 1 2006 A රු. 11,730-10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 රු. 17,600 (IV) වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු (කා. සේ. සේ. III පන්තිය) | 01 | රා. ප. ච. 06/2006 (iv) අනුව PL1 -2006 A - රු. 11,730 - 10 x 120 -10 x 130 - 10 x 145-12 x 160 - රු. 17,600 (iv) වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/09 වැනි වසර සමත්ව තිබීම. |

*බඳවා ගැනීමේ කොන්දේසි :-*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්කරු අයදුම්පත් කැඳවන දින වන විට පූර්වාසන්න වසර 03 ක කාලයක් සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (ප්‍රාදේශීය ලේකම් මගින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)

(iii) සීතාවක ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ව්‍යාපෘති පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

(iv) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

(v) 2013.06.07 වන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. (එහෙත් දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර රාජ්‍ය සේවකයින්ට මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

(vi) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියේ වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

(vii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරීන්ට තනතුරු සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05 ක කාලය තුල ලබා ගත යුතු සියලුම වැටුප් වර්ධක නියමිත දින ලබා ගත්තා වූද සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.

(viii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/95 විධි විධාන අනුව බඳවා ගැනීම සිදු කෙරේ.

(ix) ඉහත දක්වා ඇති එක් එක් තනතුරු සඳහා අදාලව ඒ ඉදිරියේ ඉල්ලා ඇති අවම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(x) බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

(xi) අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර වසර 03 අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි වලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසි වලටද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලටද, ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හෝ රෙගුලාසිවලටද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥා පනත්, පනත්වල විධි විධාන වලටද, සීතාවක ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන ලද/ලබන නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

*අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය ඃ*

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව "A4" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2013.06.07 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලේකම්, සීතාවක ප්‍රාදේශීය සභාව, හංවැල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය. තැපෑලේදී නැති වන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියවිලිවල සහතික පිටපත් එවිය යුතුය ඃ-

(i) උප්පැන්න සහතිකය;
(ii) ජාතික හැඳුනුම්පත ;
(iii) අධ්‍යාපන සහතික හෝ ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික ;
(iv) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය ;
(v) සේවා සුදුසුකම් දැක්වෙන සහතික;
(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

කේ. ඒ. චන්දන පද්මසිරි,
ලේකම්,
සීතාවක ප්‍රාදේශීය සභාව.

2013 මැයි මස 03 වැනි දින,
සීතාවක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම*
*සීතාවක ප්‍රාදේශීය සභාව*

*............................................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.
03. තැපැල් ලිපිනය :——————————.
04. දුරකථන අංකය :——————————.
05. උපන් දිනය:——————————.
වර්ෂය:——————————. මාසය:——————————.දිනය:——————————.
06. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
07. 2013.06.07 වෙනි දිනට වයස ඃ අවුරුදු :——————————.මාස:——————————. දින:——————————.
08. ස්ත්‍රී පුරුෂ භාවය:——————————.
09. විවාහක/අවිවාහක බව:——————————.
10. ජාතිය:——————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද? යන බව:——————————.
12. අධ්‍යාපන සුදුසුකම්:——————————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්:——————————.
14. ඔබ දැනටමත් සීතාවක ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් -
    (i) දැනට දරන තනතුර :——————————.
    (ii) එම තනතුරට පත් වූ දිනය:——————————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ව්‍යාපෘති පදනම මතද?):——————————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

05-526

## ගම්පොල නගර සභාව

ගම්පොල නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුසුකම් සපුරා ඇති ගම්පොල නගර සභා සීමාව තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු 111 පන්තිය ට්‍රැක්ටර් | 06 | 06 2006 IV-PL3 රු. 12,470-130x 10-145x10- 160x10-170x12- රු.18,860 | 1. රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය.<br>2. දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයක් තිබිය යුතු අතර, මනා දෑස් පෙනීමක් තිබිය යුතුය.<br>3. මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.<br>4. අවම උස අඩි 05ක් විය යුතුය.<br>5. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ.) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතුය. |
| 02 | කාර්යාල කාර්ය සහායක | 04 | රු. 11,730-10x 120-10x180-10x145-12x160-රු.17,600 | 1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතුය. |
| 03 | මාතෘ සායන සහායිකා | 01 | 06 2006 IV-PL3 රු. 12,470-130x 10-145x10- 160x10-170x12- රු.18,860 | 1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතුය. |

බඳවා ගැනීම සඳහා පොදු සුදුසුකම් :

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු යි.
2. අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවකු වියයුතු ය.
3. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය.
4. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
5. ගම්පොල නගර සභාවේ දැනට තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු සේවකයින්ට වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.
6. සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලබයි.
7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු හෝ දඬුවම් ලැබූවෙකු නොවිය යුතු යි.
8. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම ගම්පොල නගර සභාවේ ලේකම් සතු ය.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවාගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.
2. ස්ථිර පත්වීමක්. අවු. 03ක පරිවාස කාලයකට යටතේ වේ.
3. මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා මධ්‍යම පළාත් රජය හා සභාව වරින්වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටී.

*අයදුම් කිරීමේ පිළිවෙල :*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය "A4" ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ අයදුම්පත් 2013.06.15 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, ගම්පොල නගර සභාව, ගම්පොල යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතු ය.
3. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය :-
    01. උප්පැන්න සහතිකය,
    02. අධ්‍යාපන සහතික,

03. පදිංචිය සනාථ කිරීමේ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
04. ග්‍රාම නිලධාරීගෙන් ලබාගත් චරිත සහතිකය,
05. පළපුරුද්ද සහ වෘත්තිය සුදුසුකම් පිළිබඳ සහතිකය.

එච්. ටී. සිරිමා ජයලීල,
ලේකම්,
ගම්පොල නගර සභාව,

2013 මැයි මස 02 වැනි දින,
ගම්පොල නගර සභාව.

ආදර්ශ අයදුම්පත්‍රය

***මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ගම්පොල නගර සභාවේ ………………… තනතුර සඳහා වූ අයදුම්පත්‍රය***

01. මුල’කුරු සමග නම : ——————.
02. මුල’කුරුවලින් හැඳින්වෙන නම් : —————.
03. ස්ථිර ලිපිනය : ——————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ——————.
05. ජාතික හැඳුනුම්පත් අංකය : ——————.

06. උපන් දිනය :
අවුරුද්ද : —————. මාසය : —————. දිනය : —————.

07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු : —————. මාස : —————. දින : —————.

08. ස්ත්‍රී/පුරුෂ භාවය : —————.
09. විවාහක/අවිවාහක බව : —————.
10. ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ උපතින්ද? ලියාපදිංචිවීමෙන් ද? : —————.
11. අධ්‍යාපන සුදුසුකම් : —————.
12. වෙනත් සුදුසුකම් : —————.
13. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් -
    1. දැනට දරන තනතුර : —————.
    2. ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ද යන වග : —————.
    3. එම තනතුරට පත් වූ දිනය : —————.

14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද? : —————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

**දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු/කාරිය වන ………………… මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ ………………… වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ——————.
තනතුර : ——————.
නිල මුද්‍රාව : ——————.

05-495

## මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ වත්තේගම නගර සභාව සඳහා රියදුරු/ආදාහනාගාර ක්‍රියාකරු/ආදාහනාගාර ක්‍රියාකාර සහයක තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ වත්තේගම නගර සභාවේ පුරප්පාඩුවී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති වත්තේගම නගර සීමාව තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් 2013.06.10 දිනට පෙර "ලේකම්, වත්තේගම නගර සභාව, වත්තේගම" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ කොටසේ වත්තේගම නගර සභාවේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය. (වත්තේගම නගර සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, ආදේශක සේවකයින්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.)

| *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| රියදුරු III පන්තිය | 02 | 06./2006 iv-PL3-3-2006A<br>රු.12,470-130x10-145x10-160x10-170,x12-රු. 18,860 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබීම;<br><br>මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද රිය පැදවීමේ නිපුණතාවය පිළිබඳ බලපත්‍රය C,C1,D,D1 කාණ්ඩ සඳහා ලබා තිබීම;<br><br>හා<br><br>දිවා හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් යෝග්‍ය තත්ත්වයෙන් සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය;<br>හා<br>අවම උස අඟල් 62.5ක් විය යුතුය. ටේලරය සමග ට්‍රැක්ටරය පැදවීමේ නිපුනතාවයක් ලබා ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| ආදාහනාගාර ක්‍රියාකරු | 01 | 06./2006 iv-PL2<br>රු.12,210-10x 130-10x145 -10x160 -12x170 රු. 18,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙක කට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය. වෘත්තිය පිළිබඳ ශිල්පීය සහතික ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ; |
| ආදාහනාගාර ක්‍රියාකාර සහයක | 01 | 06./2006 iv-PL1<br>රු.11,730-120x10-130x10-145x10-160x12-රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය; |

*රියැදුරන් බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය.
2. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන්නාවූ අයදුම්කරුවන් පත් කිරීමට පෙර පොලිස් රථ ප්‍රවාහන අංශයේ නිලධාරියෙකුගෙන් ද, සමන්විත තිදෙනෙකුට නොඅඩු පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
3. සේවයට බඳවාගැනීම අදාළ පළාත් පාලන ආයතනයේ පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

*ආදාහනාගාර ක්‍රියාකරු සඳහා වෘත්තීය සුදුසුකම් :*

1. වෘත්තීය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද තහවුරු කළ යුතුය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.
- එසේම රාජ්‍ය සේවා පත්කිරීම් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.
- තෝරාගනු ලබන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායක තත්ත්වයක නොමැති වුවහොත් ඉවත් කරනු ලැබේ.
- දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක් තිබිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.
- රියදුරු III බණ්ඩයට බඳවා ගැනීමේදී පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය. (බඳවාගන්නා දිනට වසර 03කට පෙර අදාළ සහතිකය ලබා සිටිය යුතුය. (වාහන පන්තිය C,C1,D සහ D1 හෝ G )

*වෙනත් පොදු කොන්දේසි* :

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වත්තේගම නගර සීමාව තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙක් විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
- අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකික විය යුතු ය.
- විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
- දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
- රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.
- රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීම හැර) දඬුවමක් ලබා නැත්තා වූ ද, මෙම කාලය තුළ යෙදුණු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබාගත්තා වූ ද, සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු ය. තෝරාගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතු ය.
- වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව අයදුම්කරු ත්‍රිවිධ හමුදාව හා ආරක්ෂක සේවයේ නිරත වී සිට විධිමත් පරිදි සේවයෙන් මුදා නොහැරි අය නොවිය යුතු ය.
- මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, මධ්‍යම පළාත් සභාව හෝ වත්තේගම නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.
- මෙම බඳවා ගැනීම් නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද වත්තේගම නගර සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

***අයදුම්කළ යුතු ආකාරය*** .- මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් සහතිකවල ඡායාස්ථ පිටපත් සමග 2013.06.10 දිනට ප්‍රථම මා වෙත ලැබෙන්න සලස්වන්න :-

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික හා වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික ;
3. පදිංචිය පිළිබඳව ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ යුතුය.);
4. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ;
5. පළපුරුද්ද දැක්වෙන සහතිකය ;

පී. එස්. බී. මඩුගල්ලේ,
ලේකම්,
වත්තේගම නගර සභාව.
වත්තේගම.

2013 මැයි 17 වැනි දින දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**
**වත්තේගම නගර සභාව**

*............................................ තනතුර සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
02. ස්ථිර ලිපිනය :————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :————.
05. උපන් දිනය: වර්ෂය:————. මාසය:————. දිනය :————.
06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
08. විවාහක/අවිවාහක බව :————.
09. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද. ලියාපදිංචිවීමෙන් ද යන වග :————.
10. අධ්‍යාපන සුදුසුකම්(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.) :
අ.පො.ස. (සා. පෙළ) විභාගය
සමත් වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| *1.* | | *5.* | |
| *2.* | | *6.* | |
| *3.* | | *7.* | |
| *4.* | | *8.* | |

11. (1) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.
(2) වෘත්තීය සුදුසුකම් :————.
(3) සේවා පළපුරුද්ද :————.
12. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර :
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් /ආදේශක ද යන වග :————.
එම තනතුරට පත්වූ දිනය :————.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ............................................ මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමණ ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
(නිල මුද්‍රාව තැබිය යුතුය.)

05-496

## මොරටුව මහ නගර සභාව

### තනතුරු ඇබෑර්තු පිරවීම

2013 මාර්තු මස 15 වැනි දින මොරටුව මහ නගර සභාව මගින් පළාත් පාලන *ගැසට් පත්‍රයේ* පල කරන ලද තනතුරු ඇබෑර්තු පිරවීම සම්බන්ධව දැන්වීම්වල සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2013 ජූනි මස 10 දක්වා දීර්ඝ කරනු ලැබේ.

දැනට මොරටුව නගර සභාවේ සේවයේ නියුක්ත අනියම්/තාවකාලික/ආදේශක/ කොන්ත්‍රාත් පදනම මත හෝ ව්‍යාපෘතියක් යටතේ සේවයේ යෙදී සිටින සේවකයින්හට ද අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අතර, අයදුම්පත් නාගරික කොමසාරිස් නමින් ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය හැකි බව ද දන්වමි.

එස්. කේ. ජයසුන්දර,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2013 මැයි මස 07 වැනි දින මොරටුව මහ නගර සභාවේ දී ය.

05-550

---

## කළුතර ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු

කළුතර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම - මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *අධ්‍යාපන සුදුසුකම් අභ්‍යන්තර* | *අධ්‍යාපන සුදුසුකම් බාහිර* | *වෙනත් සුදුසුකම්* | *වැටුප් පරිමාණය* | *බඳවා ගැනීම* |
|---|---|---|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර පරිපාලක II | 01 | පළාත් පාලන ආයතනයක අවු 10 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වැනි පන්තිය සමත් වී තිබීම | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ගණිතය/ වාණිජ ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම ; හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවක දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම. | | MN 1 - 2006A 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - 22,040 4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත . 1. සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම පැය 1 1/2 2. සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම - පැය 1 ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |
| 02 | සෞඛ්‍ය පරිපාලක II | 01 | සිංහල/දෙමළ ගණිතය/ අංක ගණිතය/වාණිජ අංක ගණිතය, ස්වස්ථතාව හා ශාරීරික විද්‍යාව/විද්‍යාව ඇතුළුව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සාමාර්ථය ලබා සිටින පළාත් පාලන ආයතනය ස්ථිර තනතුරක් දරන්නෙකු, හෝ | සිංහල/දෙමළ සහ ගණිතය/ අංක ගණිතය/වාණිජ අංක ගණිතය ස්වස්ථතාව හා ශාරීරික විද්‍යාව/සෞඛ්‍ය විද්‍යාව/විද්‍යාව ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වී තිබීම. | | MN1 - 2006 A 13,120 - 10 x 145 - 11 x 170- 10 x 240 - 10 x 320 -22,040 4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත. 1. සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම පැය1 1/2 2. සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම - පැය 1 ක ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ. |

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අභ්‍යන්තර | බාහිර | වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | | | පළාත් පාලන ආයතනයක අවු 10 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වැනි පන්තිය සාමාර්ථය ලබා තිබීම. | | | | |
| 03. | ආදාහනාගාර ක්‍රියාකරු III | 01 | අවම වශයෙන් අටවන ශ්‍රේණිය/ නවය වසර සමත්වී තිබීම. | ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී කුමණ හෝ විෂයයන් දෙකක් සමත් වී තිබීම. | තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. *අභ්‍යන්තර අයදුම්කරුවන්* (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. *බාහිර අයදුම්කරුවන්* රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. | PL2 - 2006A 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - 18,600<br><br>4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | නියමිත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර, ඉන් ලබන කුසලතාවය මත පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. |
| 04. | ආදාහනාගාර ක්‍රියාකරු සහායක II | 01 | අවම වශයෙන් අටවන ශ්‍රේණිය/ නවය වසර සමත්වී තිබීම. | අවම වශයෙන් අටවන ශ්‍රේණිය/නවය වසර සමත්වී තිබීම. | | PL1-2006A 11,730 - 10 x 120 - 10 x130 - 10 x 145 - 12 x 160 - 17,600<br><br>4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | නියමිත සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් බඳවා ගනු ලැබේ. |
| 05. | යන්ත්‍ර ක්‍රියාකරු II | 02 | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම. | ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී කුමන හෝ විෂයයන් 02 ක් සමත්වී තිබිය යුතුය. | (i) තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32 ට වඩා ගෙනයාමට බලපත්‍ර ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුයි.<br>(ii) අවම උස අඩි 5 අඟල් 6 ක් විය යුතු ය.<br>(iii) බඳවා ගැනීමට යෝජිත තනතුරට අදාල බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව රජයේ හෝ පිළිගත් ආයතනයකින් | PL2 - 2006A 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - 18,600<br><br>4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | වාචික හා ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ඉන් ලබන කුසලතාවය මත සේවයට බඳවා ගනු ලැබේ. |

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන | අභ්‍යන්තර | බාහිර | වෙනත් සුදුසුකම් | වැටුප් පරිමාණය | බඳවා ගැනීම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | වසරකට නොඅඩු ප්‍රවීණතාවයක් ලබා තිබීම (පිළිගත් ආයතනය වශයෙන් රජයේ ආයතනයක්, පළාත් රාජ්‍ය ආයතනයක්, අර්ධ රාජ්‍ය ආයතනයක් පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයක් හැඳින්වේ.)<br><br>(iv) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් තිබිය යුතුය. | | |
| 06. | වැඩ ක්ෂේත්‍ර කම්කරු III | 01 | අවම වශයෙන් 5 වන ශ්‍රේණිය/6 වසර සමත් වී තිබීම. | අවම වශයෙන් 5 වන ශ්‍රේණිය/6 වසර සමත් වී තිබීම. | | PL-1-2006A 11,730 - 10 x 120 - 10 x 130- 10 x 145 - 12 x 160 - 17,600<br><br>4 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) ශ්‍රී ලාංකිකයකු විය යුතු ය.
(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතු ය. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
(iii) බස්නාහිර පළාත තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03 ක ස්ථිර පදිංචිය ඇති අයකු විය යුතු ය.
(iv) කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(v) යහපත් චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
(vii) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයකු විය යුතු ය.
(viii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.
(ix) කළුතර ප්‍රාදේශීය සභාවේ දැනට අනියම් ආදේශක, කොන්ත්‍රාත් (වැඩ ඒකක) සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කරනු ලැබේ.
(x) යන්ත්‍ර ක්‍රියාකරු සහ වැඩ ක්ෂේත්‍ර/කම්කරු තනතුරු සඳහා දැනට ස්ථිර සේවයේ නියුතු අයට ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.
(xi) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර, කාලසීමාවේදී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවාගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීමද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*03.* සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවයකින් අවුරුදු 01ක පරිවාස කාලයකට යටත් වේ.
(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.
(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.
(iv) මෙම බඳවාගැනීම් කොන්දේසි රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද/රජයේ මුදල් රෙගුලාසිවලටද/රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාත් සභාව හෝ කළුතර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා තිබිය යුතු ය :-

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) ජාතික හැඳුනුම්පත හා ඡායා පිටපත;
(iv) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය;
(v) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (මින් 1 ක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතු ය.);
(vi) පළපුරුද්ද පිළිබඳ සහතිකය;
(vii) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික .

05. *අයදුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ අයදුම්පත් සකස්කර ඉල්ලුම් කරන තනතුර අදාල කවරයේ වම්පස ලියා අංක 4 ඡේදයේ දක්වා ඇති ලියකියවිලි ද සමගින් 2013.06.07 දින හෝ එදිනට පෙර "ලේකම්, කළුතර ප්‍රාදේශීය සභාව, ගාලුපාර, වස්කඩුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ගීතානි ඩී. ලොකුවැල්ල,
ලේකම්,
කළුතර ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**කළුතර ප්‍රාදේශීය සභාව**

.......................................................... *තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :————.
(i) මුලකුරු වලින් හැඳින්වෙන නම් :————.

02. ස්ථිර ලිපිනය:————.

03. උපන් දිනය :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

06. දුරකථන අංකය :————.

07. විවාහක/අවිවාහක බව :————.

08. අධ්‍යාපන සුදුසුකම් :—

8.1 අයදුම්කරුවන් අවසන්වරට සමත් වූ පන්තිය :————.

8.2 අ.පො.ස. (සා.පෙළ) විභාගය :—

(i) වර්ෂය :————. මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| *1.* | | *6.* | |
| *2.* | | *7.* | |
| *3.* | | *8.* | |
| *4.* | | *9.* | |
| *5.* | | *10.* | |

8.3 අ.පො.ස. (උ.පෙළ) විභාගය ා
(i) වර්ෂය :————. මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂය* | *සාමාර්ථය* |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

09. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————.
10. වෙනත් සුදුසුකම් :————.
11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද/නැත්ද යන වග :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවාගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමටද යටත්වන බවද මම දනිමි.

————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

05-582

---

# පළාත් පාලන නිවේදන

## මාතර මහා නගර සභාව

1975 අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ වීථි නම් කිරීම

මාතර මහා නගර සභාවේ සභා සම්මුතියට අනුව, වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී ා-

මහා නගර සභා ආඥා පනතේ 252 අධිකාරිය ප්‍රකාර 71(1) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 හි අංක 4 දරන වීථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබා දෙන ලද අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උප ලේඛනයේ විස්තර කර ඇති පරිදි, වර්තමාන නමින් ඇති මාවත් අලුතින් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

රංජිත් යාපා,
නාගරික කොමසාරිස්.

2013 මාර්තු මස 20 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දීය.

*උපලේඛනය*

| | *පළාත් පාලන ආයතනයේ නම* | *දිස්ත්‍රික්කය* | *වීථියේ වර්තමාන නම* | *අළුතින් යොදා ඇති නම* | *මාර්ග විස්තර* |
|---|---|---|---|---|---|
| 01 | මාතර මහා නගර සභාව | මාතර | උයන්වත්ත ධර්මරත්න මාවත, පළමුවන පටුමග | සිරිසේන රත්නපුලි මාවත | උයන්වත්ත ධර්මරත්න මාවතින් ආරම්භවී ස්වර්ණ ජයන්ති මාවතේ අවසානය දක්වා |
| 02. | මාතර මහා නගර සභාව | මාතර | දැල්කඩ පාර | සී. ඒ. හරිස්චන්ද්‍ර මාවත | රාහුල පාරෙන් ආරම්භ වී කුමාරදාස මාවතින් අවසාන වේ. |

| පළාත් පාලන ආයතනයේ නම | දිස්ත්‍රික්කය | වීථියේ වර්තමාන නම | අළුතින් යොදා ඇති නම | මාර්ග විස්තරය |
|---|---|---|---|---|
| 03. මාතර මහ නගර සභාව | මාතර | උයන්වත්ත දකුණ කන්දෙවත්ත පාර | වෛද්‍ය හේවමංග අබේවික්‍රම සිරිවර්ධන මාවත | උයන්වත්ත පිලදූව පාරෙන් ආරම්භ වී වේරගම්පිට කන්දේවත්ත පාරෙන් අවසන් වේ. |
| 04. මාතර මහා නගර සභාව | මාතර | උයන්වත්ත දකුණ ලුණු මෝල පාර | පූජ්‍ය කරගොඩ උයන්ගොඩ රතනජෝති නාහිමි මාවත | ආරම්භය : උයන්වත්ත ධර්මරත්න පාර<br>අවසානය : පිලදූව පාර |
| 05. මාතර මහා නගර සභාව | මාතර | පරමුල්ල පාර | කේ. කේ. ඩී. සිල්වා මාවත | ආරම්භය : කුමාරතුංග මාවත<br>අවසානය : තොටමුණ ජයමහා විහාර පාර |
| 06. මාතර මහා නගර සභාව | මාතර | කොටුව මැද පාර | මොරකැටි ආරේ සුගුණතිස්ස නාහිමි මාවත | ආරම්භය : කොටුව විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත<br>අවසානය : කොටුව ධර්මාරාම පාර |
| 07. මාතර මහා නගර සභාව | මාතර | වේරගම්පිට රජයේ නිළ නිවාස පාර (කුප්පිහිගේවත්ත) | ගජමන් නෝනා මාවත | ආරම්භය : ශ්‍රී ධර්මාරාම මාවත<br>අවසානය : රජයේ නිළ නිවස |
| 08. මාතර මහා නගර සභාව | මාතර | උයන්වත්ත ධර්මරත්න මාවත, 4 වන පටුමග | එස්. එල්. ප්‍රනාන්දු මාවත | ආරම්භය : උයන්වත්ත ධර්මරත්න මාවත<br>අවසානය : එම මාර්ගයේ නිවාස |
| 09. මාතර මහ නගර සභාව | මාතර | පත්තිලගෙවත්ත මාවත | සමාධි පෙදෙස | ආරම්භය : ගාල්ල මාතර ප්‍රධාන පාර<br>අවසානය : එම මාර්ගයේ නිවාස |
| 10. මාතර මහා නගර සභාව | මාතර | පිස්සිගෙවත්ත පාර (නම් කරන ලද පාරක් නොවේ). | සුහද මාවත | ආරම්භය : ජයමහා විහාර පාර<br>අවසානය : පරමුල්ල පාර. |
| 11. මාතර මහා නගර සභාව | මාතර | | ඒ. සී. එම්. අකිල් මාවත. | |

05-528

---

**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 හා 24 (2) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාරව වයඹ පළාත් සභාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කුරුණෑගල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මං මාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, මේ නිවේදනයේ සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

දේශබන්ධු පැට්‍රික් කරුණාසිංහ,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2013 මැයි මස 08 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව,
මල්පිටිය- බෝයගනේ.

**සමාධි මාවත - රණවන ඉසිපතන අරමට පිවිසෙන මාර්ගය**

සම්පූර්ණ දිග - අඩි 600
පළල - අඩි 08

ඉඩම් හිමියන්ගේ නාම ලේඛනය (කුරුණෑගල නගරය දෙස සිට ඉසිපතන අරම දෙසට)

*පාරේ වම් පස :*

1. රාජාංගනයේ අමරසිරි හිමි
2. විජේන්ද්‍ර ගම්ලද්දලාගේ ලසන්ත රාජකරුණා
3. විජේන්ද්‍ර ගම්ලද්දලාගේ රණවීර
4. විජේන්ද්‍ර ගම්ලද්දලාගේ නවරත්න
5. වරකාගොඩ මුලාචාරිගේ සුනිල් සිරි ප්‍රේමචන්ද්‍ර
6. වරකාගොඩ මුලාචාරිගේ ජයලත් නිමල් චන්ද්‍ර
7. බෝවල්ගහබරණ පටබැන්දලාගේ චන්ද්‍රකාන්ති ස්වර්ණලතා
8. විජේන්ද්‍ර ගම්ලද්දලාගේ නිමල් ජයසුන්දර

*පාරේ දකුණු පස :*

1. ලංසකාර අතපත්තු මුදියන්සේලාගේ දයාරත්න අතපත්තු
2. බෝවල්ගහබරණ පටබැන්දලාගේ උපාලි ධර්මසිරි
3. කොණ්ඩ සිංහ මුලාචාරි ගල්අද්දලාගේ කරුණාදාස

05-585

---

**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාත් සභාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් මෙහි දක්වා ඇති උපලේඛනයේ සඳහන් මංමාවත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනයේ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පුකිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. ඩී. සරත් සන්දනායක,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2013 මැයි මස 02 වැනි දින,
ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ.

උපලේඛනය

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *මාර්ගයේ දිග (කි. මී.)* | *මාර්ගයේ පළල (අඩි)* |
|---|---|---|---|---|---|
| 01 | අස්ගගුල ටෙලිස්පෝඩ් වත්ත හරහා තලගහහේන මාර්ගය | ඇහැලියගොඩ පොළ හංදියේ සිට | තලගහහේන | 0.50 | 16 |

06-636

## කුරුණෑගල මහ නගර සභාව

### 2013 වර්ෂය සඳහා බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම

ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරිය වන මහ නගර සභා පනත මගින් පැවරී ඇති බලතල අනුව කුරුණෑගල මහ නගර සභාව විසින් පහත සඳහන් බලපත්‍ර ගාස්තු හා බදු 2013 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. මහ නගර සභා ආඥාපනතේ 147 සහ 247(අ) වගන්තිය යටතේ ගැනෙන අප්‍රිය හා අන්තරාදායක ව්‍යාපාර සඳහා බලපත්‍ර ගාස්තු 2013 වර්ෂයේ වාර්ෂික තක්සේරුව අනුව උපලේඛන අංක 01 පරිදි 2013 වර්ෂයට ගෙවිය යුතුය.

2. මහ නගර සභා ආඥා පනතේ 247 (ආ) වගන්තිය යටතේ ගැනෙන වෙළඳාම් සම්බන්ධයෙන් කර්මාන්ත බද්ද සඳහා ගාස්තු 2013 වර්ෂයේ වාර්ෂික තක්සේරුව අනුව උපලේඛන අංක 02 පරිදි 2013 වර්ෂයට ගෙවිය යුතුය.

3. මහ නගර සභා ආඥා පනතේ 247(ඇ) වගන්තිය යටතේ ගැනෙන වෙළඳාම් සම්බන්ධයෙන් ව්‍යාපාර විෂයෙහි බදු 2012 වර්ෂයේ ආදායම මත උපලේඛන අංක 03 පරිදි 2013 වර්ෂයට ගෙවිය යුතුය.

4. මහ නගර සභා ආඥා පනතේ 247 (ඇ) වගන්තිය යටතේ මහ නගර සභාවේ පාලන සීමාව තුළ පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සුදුසුවන විටක හා ඒ ඉඩම යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි විට එම භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දෙකක් (2%) වන ප්‍රමාණයක බද්දක් එම ඉඩමේ අයිතිකරු විසින් සභාවට වාර්ෂිකව ගෙවිය යුතුය.

5. මහ නගර සභා ආඥා පනතේ 247 (ඉ) වගන්තිය යටතේ කුරුණෑගල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි කිසියම් ඉඩමක් වෙන්දේසි කරුවෙකු හෝ බ්‍රෝකර්වරයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් හෝ විකිණීමේ දී එම විකුණුම් මුදලෙන් සියයට එකක (1%) බද්දක් 2013 වර්ෂයේ ඉඩම් විකිණීමේ විෂයෙහි බදු ගෙවිය යුතුය.

6. සංචාරක මණ්ඩලයෙන් අනුමත වී ඇති හෝ මණ්ඩලය විසින් පිළිගනු ලැබ ඇති හෝටල් හෝ නවාතැන්පල වලින් එම වර්ෂයට පෙරාතුව වූ වර්ෂය සඳහා වූ ලැබීම් වලින් සියයට එකක් වූ (1%) ගාස්තුවක් එම වර්ෂය සඳහා සභාවට ගෙවිය යුතුය.

7. 2013 වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු 2013 මාර්තු 31 දිනට පෙර ගෙවිය යුතු වේ.

පී. කේ. එස්. චන්ද්‍රලතා,
නාගරික කොමසාරිස්.

මහා නගර සභාව,
කුරුණෑගල.

05-642

## කුරුණෑගල මහ නගර සභාව

### කුරුණෑගල මහ නගර සභාවේ මල්කඩුවාව පොදු සුසාන භූමියට අයත් ඉඩම් ප්‍රමාණය වෙනස්වීම ප්‍රසිද්ධ කිරීම

කුරුණෑගල මහා නාගරික සීමාව තුළ මල්කඩුවාව පිහිටා ඇති පොදු සුසාන භූමිය මැදින් ගමන් කරන නගර සභා මාර්ගය (පුබුදු මාවත) සහ උතුරු සහ වයඹ මායිමේ පිහිටි කුරුණෑගල මීගමුව ප්‍රධාන මාර්ගය වරින් වර පුළුල් වීම නිසා සුසාන භූමියට අයත් බිම් ප්‍රමාණයේ සිදුව ඇති වෙනස් වීම මත පහත සඳහන් උපලේඛනයේ මායිම් තුළ දැනට පවතින බිම් ප්‍රමාණය අදාළ විෂය භාර අමාත්‍යවරයා මඟින් ප්‍රසිද්ධ කිරීමට 2010.05.26 වැනි දින රැස්වූ කුරුණෑගල මහා නගර සභාවේ 05 (07) දරන සභා සම්මුතිය මඟින් පිළිගෙන ඇත.

එකී යෝජනා සම්මුතිය ගැසට් මඟින් ප්‍රසිද්ධකර පළ කිරීම සඳහා 1989 අංක 12 දරන පළාත් සභා අනුශාංගික (විශේෂ විධිවිධාන) පනතේ 02 වගන්තිය සමඟ කියවිය යුතු සුසාන භූමි සහ පෞද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනතේ වයඹ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍ය සහ වයඹ ගරු ප්‍රධාන අමාත්‍ය නීතිඥ අතුල සරත් කුමාර විජේසිංහ මැතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමැතිය ලබාදී ඇත.

#### උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගම් 10 කෝරළයේ කුරුණෑගල මහා නාගරිකයේ මඩමේගම පිහිටි කොටුවේ හේන නම් ඉඩම 2011.06.27 දින නැවත මැනීම කර බලයලත් මිනින්දෝරු කෝලිත ඩී. දසනායක විසින් මැන සාදන ලද අංක 1348 ඒ දරන පිඹුරේ පිළිවෙලින් පහත පරිදි ප්‍රමාණයන් හා මායිම් දැක්වෙන කැබලි අංක 01 සහ 02 යන කැබලි දෙකේ ඒකාබද්ධ ප්‍රමාණය අක්කර 10යි රූඩ් 01 යි පර්චස් 26.1 හෙවත් හෙක්ටයාර් 4.21405 න් මල්කඩුවාව පොදු සුසාන භූමිය ලෙස භාවිතා කෙරේ. එකී කැබලි 02 පහත සඳහන් පරිදි වෙන් වෙන්ව විස්තර කෙරේ.

*කැබලි අංක 01 (ප්‍රමාණය අක්කර 07යි රූඩ් 02 පර්චස් 09) :*

| | | |
|---|---|---|
| *උතුර* | : | මීගමුපාර සහ මීගමුපාරෙන් කොළඹ පාරට සහ මහා නගර සභා මාර්ගය ; |
| *නැගෙනහිර* | : | මීගමු පාරෙන් කොළඹ පාරට යන මහා නගර සභා මාර්ගය; |
| *දකුණ* | : | රාජිත ජයතිලක සහ තව අයට අයිති ඉඩම සහ කුරුණෑගල කාලගුණ දෙපාර්තමේන්තු කාර්යාලය; |
| *බටහිර* | : | රාජිත ජයතිලක සහ තවත් අයට අයිති ඉඩම සහ මීගමු පාර. |

*කැබලි අංක 02 (අක්කර 02යි රූඩ් 03යි පර්චස් 17.1) :*

| | | |
|---|---|---|
| *උතුර* | : | මීගමු පාර සහ පෝරනේ වත්ත පාර; |
| *නැගෙනහිර* | : | පීපී 7764/3A සහ පීපී 7764/3B යන ඉඩම් කොටස්; |
| *දකුණ* | : | මීගමු පාරෙන් කොළඹ පාරට යන නගර සභා පාර සහ පීපී 7764/3B යන ඉඩම්; |
| *බටහිර* | : | මීගමු පාරෙන් කොළඹ පාරට යන මාර්ගය. |

ජී. කේ. එස්. චන්ද්‍රලතා,
නාගරික කොමසාරිස්.

මහා නගර සභාව,
කුරුණෑගල.

05-643

# විවිධ දැන්වීම්

**මාවතගම ප්‍රාදේශීය සභාව**

සුසාන භූමි ආඥාපනත (231 වැනි අධිකාරිය)
1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වැනි වගන්තිය හා (231 වැනි අධිකාරිය)

සුසාන භූමි ආඥාපනතේ 03 වැනි වගන්තියේ හා 17 සිට 22 වගන්තිය අනුව සඳහන් කාර්යයන් සඳහා එකී ආඥාපනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මාවතගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මතු දැක්වෙන උපලේඛනයේ සඳහන් සුසාන භූමිවල භූමිදාන කිරීමක්, ආදාහනය කිරීම හා තැන්පත් කිරීමක් සඳහා ද ස්මාරකයක් ඉදිකිරීමක් සඳහා ද ගාස්තු 2013 මැයි 01 දින සිට අය කිරීමට 2013.03.28 වන සභා රැස්වීමේදී තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. උපුල් පෙරේරා,
සභාපති,
මාවතගම ප්‍රාදේශීය සභාව.

2013 අප්‍රේල් මස 01 වැනි දින,
මාවතගම,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

01. වැව ගෙදර සුසාන භූමිය
02. පොතුබෝව - කොවිල්ලන්ද සුසාන භූමිය
03. මීතැන්වල වල් අරඹේ සුසාන භූමිය
04. කළුගමුව වැලිහින්නේ හේන සුසාන භූමිය
05. ටිගොල ඇටඹගහවෙල සුසාන භූමිය
06. දුනුකේවත්ත පොල්ගහමුල හේන සුසාන භූමිය

| | | රු. ශත |
|---|---|---|
| 01. | වයස් සීමාවකින් තොරව එක් භූමදාන කිරීමක් සඳහා අවසර පත්‍ර හා ගාස්තු | 50 0 |
| 02. | වයස් සීමාවකින් තොරව එක් ආදාහන කිරීමක් සඳහා ගාස්තු | 75 0 |
| 03. | වයස් සීමාවකින් තොරව එක් තැන්පත් කිරීමක් (උපරිම බිම් ප්‍රමාණය වර්ග අඩි 18) | 3,000 0 |
| 04. | ස්මාරකයක් ඉදිකිරීම සඳහා ගාස්තුව වර්ග අඩියකට (උපරිම වර්ග අඩි 10) | 200 0 |

05-493

---

**දිඹුලාගල ප්‍රාදේශීය සභාව**

විනෝද බදු ආඥාපනත යටතේ බදු අය කිරීම

267 වැනි අධිකාරිය වන විනෝද බදු ආඥාපනතේ 11 වැනි වගන්තිය 1 වෙනි උප වගන්තිය යටතේ සභාව විසින් සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයෙහි පැවැත්වෙන (ආඥා පනතේ විස්තර කොට ඇති පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුලුවීම පිණිස අයකරනු ලබන ගාස්තුවලින් 10% බද්දක් 2013 වර්ෂය සඳහා අයකිරීමට 2012 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එස්. ජගත් සමරවික්‍රම,
සභාපති,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 26 වැනි දින,
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

05-527/6

## දිඹුලාගල ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2013 වර්ෂය

1987 අංක 15 දරන පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2012 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. ජගත් සමරවික්‍රම,
සභාපති,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 26 වැනි දින,
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ පනතේ විධිවිධාන යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා දිඹුලාගල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් මෙම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

| *අන්තරාදායක ව්‍යාපාර* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* <br> *රු. ශ.* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* <br> *රු. ශ.* | *වාර්ෂික වටිනාකම රු.1,500 ඉක්මවන අවස්ථාවක* <br> *රු. ශ.* |
|---|---|---|---|
| ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| වෙල්ඩින් වැඩ පළක් හෝ ග්‍රිල් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| බලවේග යන්ත්‍ර මගින් නූල් නිෂ්පාදනය, පුළුන් සකස් කිරීම හා රෙදි වියීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ස්ක්‍රීන් ප්‍රින්ටින් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ වෙනත් සිමෙන්ති භාණ්ඩ නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 500 0 | 1,000 0 |
| සිමෙන්ති බ්ලොක් ගල්, මල් පෝච්චි, බීරලු නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 750 0 |
| වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, පරිගණක යන්ත්‍ර, සෙලියුලර් දුරකථන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| මොටර් කොයිල් එතීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| පොහොර වර්ග, කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම, සත්ව ආහාර වර්ග නිපදවීම, ගබඩාකර තැබීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ගල්වලක් හෝ අතින් ගල් කඩන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| බෝට්ටු එන්ජින් අලුත්වැඩියා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| වී පාහින මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, කැමරා, වීඩියෝ, ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| විදුලි බලයෙන් හෝ අත් යන්ත්‍ර මගින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| අලුතින් පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ගල් ස්මාරක, සිහිවටන පුවරු සෑදීමේ හෝ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| විදුලි උත්පාදක යන්ත්‍ර (ජෙනරේටර්) කුලියට දීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීම, ගල් පිපිරවීම, ගල් මෝලක් පවත්වාගෙන යාම | 360 0 | 1,200 0 | 3,000 0 |

| *අප්‍රසන්න ව්‍යාපාර* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු.1,500 ඉක්මවන අවස්ථාවක* |
|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| කූල්ස්පොට් එකක් හෝ කිරිහලක් හෝ ස්නැක් බාර් එකක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| බිත්තර සිල්ලරට හෝ තොග විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| රස කැවිලි නිපදවීම, කේක් වර්ග නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| පපඩම් හෝ නූඩ්ල්ස් නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ජෑම්, සිරප්, සෝස් වර්ග, නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කරවල, ජාඩි, වේලීමේ හෝ විකිණීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කුරුඳු තැලීම කුරුඳු තෙල් මඩුවක් පවත්වාගෙන යාම හෝ කුරුඳු දර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ඔසු පැන්හලක්, කොළ කැඳ හෝ බැදපු කඩල, රටකජු (ටේස්ට් කඩල) | 500 0 | 750 0 | 1,000 0 |
| පානීය ජලය බෝතල් කර ගබඩා කර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කුකුළන් 1000ට අඩු කුකුල් කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කුකුළන් 1,000ට වැඩි කුකුල් කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ඌරන් 25ට අඩු ඌරු කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 1,000 0 |
| ඌරන් 25ට වැඩි ඌරු කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| එළදෙනුන් 25ට අඩු ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 1,000 0 |
| එළදෙනුන් 25ට වැඩි ඇති කිරීමේ ස්ථානයක් පවත්ාවගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු.1,500 ඉක්මවන අවස්ථාවක* |
|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| මිරිස්, ධාන්‍ය වර්ග, පිටි ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| බැටරි චාජ් කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ෆයිබර් ග්ලාස් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කොහු මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| පොල් ලෙලි හා දැව පල් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| හුණු වැරටි පිළිස්සීම සඳහා පෝරනුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| හම් වර්ග පදම් කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| හම් වර්ගවලින් හෝ රබර් වර්ග වලින් භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| රබර් බුෂ් සාදන වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| රබර් දුම් ගෙයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ගිණිකෙළි භාණ්ඩ, රතිඤ්ඤා නිපදවීම හෝ විකිණීම හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| වාහන ගෑස් කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ගෑස් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| රෙදි පින්තාරු කිරීම (බතික් වැඩපළක්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ස්වර්ණාභරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| *අන්තරාදායක හා අප්‍රසන්නන ව්‍යාපාර* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු.1,500 ඉක්මවන අවස්ථාවක* |
|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| ස්වර්ණාභරණ පාට කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| මෙට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| සබන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ලෝහ භාණ්ඩ නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| පිත්තල භාණ්ඩ නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ටයර් ටියුබ් වෝල්කනයිසිං කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| අලුත් හෝ පරණ ටයර්, ටියුබ් ගබඩා කිරීම, කට්ටා කැපීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කොප්පරා නිෂ්පාදනය කිරීම, ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| අවමංගල සේවා සපයන ස්ථානයක් (මල් ශාලාවක්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| වාහන ගාල් කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| පොල් තෙල් හෝ වෙනත් තෙල් වර්ග නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

| *බලපත්‍රයෙන් බලය දෙනු ලබන කාර්යයන්* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු.1,500 ඉක්මවන අවස්ථාවක* |
|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| ලැඟුම් නිවාසයක් පවත්වාගෙන යාම | 350 0 | 750 0 | 1,000 0 |
| හෝටලයක් පැවැත්වීම | 350 0 | 750 0 | 1,000 0 |
| බත් කඩයක් පවත්වාගෙන යාම | 350 0 | 750 0 | 1,000 0 |
| ආපනශාලාවක් පැවැත්වීම | 400 0 | 750 0 | 1,000 0 |
| තේ කඩයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 800 0 |
| කෝපි කඩයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 800 0 |
| බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 600 0 |
| කිරි විකිණීම | 350 0 | 550 0 | 700 0 |
| මාලු විකිණීම | 400 0 | 600 0 | 700 0 |
| මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 300 0 | 550 0 | 700 0 |
| ගවගාලක් පවත්වාගෙන යාම | 350 0 | 600 0 | 800 0 |
| පෞද්ගලික වෙළඳපොළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| කොණ්ඩා සැකසීමේ සැලූන් හලක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 700 0 |
| බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 350 0 | 550 0 | 700 0 |
| ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| උත්සව ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| විදේශ සේවා නියෝජිත කාර්යාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

එසේ වුව ද යම් පරිශ්‍රයක් හෝටලයක, ආපනශාලාවක හෝ නවාතැන්පොළක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නා වූ ද 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පොළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, අනුමත කර හෝ පිළිගත්තා වූ ද අවස්ථාවක බලපත්‍ර ගාස්තු 2007 වර්ෂයේ ඒ හෝටලයේ, ආපන ශාලාවේ හෝ නවාතැන්පොළෙහි ආදායමෙන් 01% ක් විය යුතුය.

05-527/1

## දිඹුලාගල ප්‍රාදේශීය සභාව

2013 වර්ෂයට කර්මාන්ත බද්දක් පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2012 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. ජගත් සමරවික්‍රම,
සභාපති,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 26 වැනි දින,
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දිඹුලාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පවත්වාගෙන යනු ලබන මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් මෙම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයේ බද්දක් 2013 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි යෝජනා කරමි.

| *කර්මාන්තයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක* |
|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| ආභරණ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 1,000 0 |
| යන්ත්‍රානුසාරයෙන් හෝ නන් අයුරින් ගඩොල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| වඩුවැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 600 0 | 800 0 |
| යෝගට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| හුණු පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 800 0 |
| කළුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| ලී ඉරුම්පළක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 |
| යකඩ කම්හලක් පවත්වාගෙන යාම | 350 0 | 700 0 | 800 0 |
| හුණු කර්මාන්තයක් පවත්වාගෙන යාම | 350 0 | 750 0 | 1,000 0 |
| ටයර් ටියුබ් වෝල්කනයිස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 750 0 | 1,000 0 |
| බෙලෙක් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 800 0 |
| ලියවන පට්ටලයක් පවත්වාගෙන යාමේ ස්ථානයක් | 400 0 | 500 0 | 800 0 |
| ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| මෝටර් වාහන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| ගඩොල් හෝ උළු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 800 0 |
| මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 550 0 | 750 0 |
| පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 600 0 | 800 0 |
| වේවැල් බඩු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 800 0 |
| සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 700 0 | 900 0 |
| පත්තර, හිස් බූලි, ගෝනි, පරණ යකඩ, බෝතල් එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |
| රස කැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |
| මිරිස් කුඩු, තුනපහ කුඩු ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |

05-527/2

## දිඹුලාගල ප්‍රාදේශීය සභාව

### ව්‍යාපාර බද්දක් පැනවීම - 2013 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2012 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. ජගත් සමරවික්‍රම,
සභාපති,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 26 වැනි දින,
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ 150 වැනි වගන්තිය යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් දිඹුලාගල ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2012 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන්ම එම ව්‍යාපාරයේ 2013 වර්ෂයේ ආදායම මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ නිරූපිත අනුප්‍රමාණය අනුව බද්දක් 2013 වර්ෂය සඳහා පනවා අයකළ යුතුයැයි යෝජනා කරමි.

*උපලේඛනය*

| *I වැනි තීරුව*<br>*2012 වර්ෂයේ දී ව්‍යාපාර ආදායම* | *II වැනි තීරුව*<br>*රු. ශ.* |
|---|---|
| රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නැත |
| රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන | 90 0 |
| රු. 12,000 ඉක්මවන එහෙත් 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| රු. 18,750 ඉක්මවන එහෙත් 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| රු. 75,000 ඉක්මවන එහෙත් 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

*ඉහත සඳහන් බදු ගෙවීමට යටත් ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධ විස්තර :*

1. කොමිස් නියෝජිතයන්
2. වෙන්දේසිකරුවන්
3. බ්‍රෝකර්වරුන්
4. කොන්ත්‍රාත්කරුවන්
5. උකස් බඩු ගන්නවුන්
6. පෞද්ගලික අධ්‍යාපන ආයතන
7. ගණන් පරීක්ෂකවරුන් හා ගණකාධිකාරි
8. ගෘහ නිර්මාණ ශිල්පීන්
9. රක්ෂණ නියෝජිතයන්
10. ප්‍රවාහන නියෝජිතයින්
11. කුලී රථ හිමියන්
12. පෞද්ගලික වාහන අයිතිකරුවන්
13. මෝටර් රථ වාහන වෙළඳුන්
14. මෝටර් රථ අමතර කොටස් වෙළඳුන්
15. රියදුරු පුහුණු කරවන්නන්
16. දෘෂ්ටි පරීක්ෂකයින්
17. මැණික් ව්‍යාපාරිකයන්
18. ස්වර්ණාභරණ ව්‍යාපාරිකයින්
19. අවමංගල්‍ය කටයුතු භාරගන්නන්
20. මිතින්දෝරුවන් (පෞද්ගලික)
21. ආහාර පාන සපයන්නන්
22. උත්සව ශාලාවක් සපයන්නන්
23. නීති කාර්යාල පැවැත්වීම
24. නොතාරිස් කාර්යාල පැවැත්වීම
25. රෝගීන්ට ප්‍රතිකාර කරන අපරදිග වෛද්‍ය ක්‍රමයේ බෙහෙත් ශාලාවක්
26. රෝගීන් ප්‍රතිකාර කරන පෙරදිග වෛද්‍ය ක්‍රමයේ බෙහෙත් ශාලාවක්
27. සිනමා ශාලා
28. වීඩියෝ ක්‍රීඩා මධ්‍යස්ථාන
29. රේස් ඔට්ටු භාරගන්නන්
30. බැංකු
31. රැකියා ඒජන්සි පවත්වාගෙන යාම (මෙරට-විදේශ)
32. දුරකථන ඒජන්සි පවත්වාගෙන යාම
33. ඇඟළුම් කර්මාන්තශාලා පවත්වාගෙන යාම
34. කාමර කුලියට දීම (05ට වැඩි)
35. ෆිනැන්ස් ආයතනයක් පවත්වාගෙනයාම
36. වෛද්‍ය පරීක්ෂණ ස්ථානයක් පවත්වාගෙන යාම
37. යම් භාණ්ඩයක් සඳහා ඒජන්තවරයෙකු ලෙස කටයුතු කිරීම
38. යම් භාණ්ඩ ගබඩාවක් පවත්වාගෙන යාම
39. යම් භාණ්ඩයක් බෙදා හැරීමේ කටයුතු කිරීම
40. යම් භාණ්ඩයක් නිෂ්පාදකයෙකු ලෙස කටයුතු කිරීම
41. යම් භාණ්ඩයක් ආනයනකරුවෙකු ලෙස කටයුතු කිරීම
42. යම් භාණ්ඩයක් අපනයනකරුවෙකු ලෙස කටයුතු කිරීම
43. යම් භාණ්ඩයක් /ද්‍රව්‍ය සපයන්නකු ලෙස කටයුතු කිරීම (ගොඩනැගිලි ද්‍රව්‍ය, මස්,මාළු වෙනත්)
44. මත්පැන් හා රටබීම විකිණීමේ ස්ථානයක් සඳහා

05-527/3

**දිඹුලාගල ප්‍රාදේශීය සභාව**

වාහන හා සත්ත්ව බද්දක් පැනවීම - 2013 වර්ෂය

1987 අංක 15 දරන සභා පනතේ 148 වැනි වගන්තිය සමඟ කියවිය යුතු ඒ පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සෑම වාහනයක් සහ සතෙක් වෙනුවෙන් මෙහි උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2013 වර්ෂයේදී පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

එස්. ජගත් සමරවික්‍රම,
සභාපති,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 26 වැනි දින,
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වන වගන්තිය සමඟ කියවිය යුතු ඒ පනතේ 147 වැනි වගන්තියේ I වැනි උප වගන්තිය යටතේ දිඹුලාගල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සෑම වාහනයක් සහ සතෙක් වෙනුවෙන් මෙහි උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2013 වර්ෂයේදී පනවා අය කළ යුතු යැයි යෝජනා කරමි.

***උපලේඛනය***

| | රු. ශ. |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් ට්‍රයිසිකලයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක් බයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා— | |
| *(අ)* වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම් | 18 0 |
| *(ආ)* වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4 0 |
| සෑම කරත්තයක් සඳහා | 10 0 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7 50 |
| සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| සෑම ඇතෙකු සඳහා | 50 0 |

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන විල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මෙම උපලේඛනයේ වෙළඳ කාර්ය යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

05-527/4

---

**දිඹුලාගල ප්‍රාදේශීය සභාව**

ප්‍රචාරක දැන්වීම් සහ දෘෂ්‍ය පරිසරය සඳහා බදු පැනවීම -2013 වර්ෂය

1987 අංක 15 දරන සභා පනතේ 22 (අ) 122-126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව 1988.08.22 වැනි දින අංක 520/7 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ iv(අ) කොටසේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ විධිවිධාන ප්‍රකාර දිඹුලාගල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් තැනැත්තෙකු විසින් යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට හෝ අහසට පෙනෙන කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සඳහා පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2013.01.01 දින සිට සංශෝධනය කරන තුරු අය කිරීමට 2012 වර්ෂයේ සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේදී යෝජනා කර සම්මත කරගන්නා ලද බව නිවේදනය කරමි.

එස්. ජගත් සමරවික්‍රම,
සභාපති,
දිඹුලාගල ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 26 වැනි දින,
දිඹුලාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

*දැන්වීම් පුවරු බැනර් ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු අයකිරීම*

| *ප්‍රදර්ශනය කරන කාල සීමාව* | *අයකරන ගාස්තුව* |
|---|---|
| | *රු. ශත* |
| 1. සති දෙකකට අඩු වර්ග අඩියක් සඳහා | 30 0 |
| 2. සති දෙකක සිට මාස 06 දක්වා වර්ග අඩියක් සඳහා | 40 0 |
| 3. මාස 06 සිට වසරක් දක්වා වර්ග අඩියකට | 50 0 |
| 4. වසරක් හෝ ඊට වැඩි වර්ග අඩියකට | 150 0 |
| 5. වෙළඳසැල් ඉදිරිපිට ඇති දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට | 60 0 |

*2013 වර්ෂය සඳහා සේවා සහ පෝරම ගාස්තු අය කිරීම :*

| | | | |
|---|---|---|---|
| (i) | අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පත්‍රයක් | 100 0 | |
| (ii) | වීථි රේඛා අයදුම්පතක් | 250 0 | |
| (iii) | වීථි රේඛා සහතිකයක් නිකුත් කිරීම | 750 0 | |
| (iv) | කොන්ත්‍රාත් ගිවිසුම් පත්‍ර සඳහා ගාස්තු | 250 0 | |
| (v) | පුස්තකාල ඉල්ලුම්පත්‍රයක් සඳහා ගාස්තු | 20 0 | |
| (vi) | මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් - | | |
| | තාර දැමූ මාර්ග | 5,000 0 | |
| | බොරළු මාර්ග | 750 0 | |
| | කොන්ක්‍රීට් මාර්ග | 3,450 0 | |
| | සුසාන භූමි - තැන්පත් කිරීම | | |
| | වර්ග අඩි 01ක් සඳහා | 30 0 | |
| | භූමිදානය කිරීම | 500 0 | |
| (vii) | පුස්තකාල සාමාජික ගාස්තු | ළමා 50 0 | වැඩිහිටි 100 0 |
| (viii) | පුස්තකාල දඩ (ප්‍රමාදවන දිනකට) | 2 0 | |
| (xi) | මහජන ක්‍රීඩාංගනය වෙන් කිරීම | 1000 0 | |
| (x) | බවුසරයෙන් ජලය සැපයීම | 1000 0 | |
| | | 500 0 | |
| | | කි. මී.01ක් සඳහා රු. 20 සහ වැඩිවන සෑම කිලෝමීටර් 01 සඳහාම රු. 20 බැගින් | |

සන්නිවේදන කුළුණු — උපරිමය රු. 10,000 කට යටත්ව කුළුණේ පාදමේ වර්ගඵලය කුළුණේ උසින් වැඩිකර ලැබෙන ඝන මීටරයකට රු. 400 බැගින්

දුරකථන කුළුණක් සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු රු. 20,000

| *ගෙබිමේ විශාලත්වය* | *නේවාසික* | *වාණිජ/නේවාසික නොවන* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| වර්ග අඩි 750 හෝ ඊට අඩු | 150 0 | 300 0 |
| වර්ග අඩි 751 හෝ 1,000 දක්වා | 250 0 | 500 0 |
| වර්ග අඩි 1,001 ක් හෝ 1,200 | 500 0 | 1,000 0 |
| වර්ග අඩි 1,201 හෝ 1,550 දක්වා | 750 0 | 1,500 0 |
| වර්ග අඩි 1,551 ට වැඩි | 1,000 0 | 2,000 0 |

05-527/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.